# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2023.02.14

වේලාව : ප.ව. 2.00

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

**මූලාසනය : ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) පී.සෝමසිරි මහතා - ආණ්ඩුකාර ලේකම්

02) තිලක් සෙනරත් මහතා - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව(බ.ප)

03) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

04) ඒ.ඩී.එස්.සදිකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)

05) සිරිසෝම ලොකුවිතාන මහතා - ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප)

06) කේ.චම්පා එන්. පෙරේරා මිය - ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප)

07) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප)

08) චන්දන රණවීර ආරච්චි මහතා - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප)

09) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

10) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

11) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)

12) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

13) කේ.ආර්.අබේසිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

14) කේ.ජී.එස්.ප්‍රසන්න මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක

15) පාලිත අබේවර්ධන මහතා - ප්‍රධාන නීති නිලධාරී

16) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | ගෙවතු වගා තරඟාවලිය හා ගෙවතු වගා වැඩසටහන පැවැත්වීම සම්බන්ධව | 2023 වර්ෂයේ දී බස්නාහිර පළාත් ගෙවතු වගා තරඟාවලිය මහල් නිවාස, පාසැල්, සේවා ආයතන ආදී ආයතන ඇතුලත්ව ඛාණ්ඩ අටක් යටතේ පැවැත්වීමට කටයුතු කරන බවත් , මේ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර මාර්තු අප්‍රේල් මාස වලදී Google form හරහා තරඟ කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර කැඳවීමට කටයුතු කරන අතර මැයි මස වන විට තරඟ පවත්වා වර්ෂය අවසාන වන විට ජයග්‍රාහකයන්ට ත්‍යාග ප්‍රදානය සිදුකරන බව කෘෂිකර්ම ලේකම් විසින් පැහැදිලි කරන ලදී.<br>තවද ගෙවතු තුන් ලක්ෂ අටදහසක් ඇති කිරීමේ ගෙවතු වැඩසටහන ක්‍රියාත්මක කරන බව වැඩි දුරටත් දන්වන ලදී.<br>මෙම වැඩසටහනෙහි ප්‍රගතිය හා පවතින ගැටළු සම්බන්ධව සාකච්ඡා කල යුතු බවත් , පොල් හා අඹ පැල වගා වැඩසටහනෙහි ප්‍රගතිය හා ගැටළු සම්බන්ධයෙන් වෙනමම සාකච්ඡා කල යුතු බවත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 02 | We green වෙළඳසැල පවත්වාගෙන යාම කෘෂි සේවා අධිකාරියට පැවරීම සම්බන්ධව | We green වෙළඳ සැල නැවත ආරම්භ කිරීම සඳහා ආණ්ඩුකාර තුමාගෙන් සුදුසු දිනයක් ලබාගෙන කෘෂි සේවා අධිකාරිය වෙත දැනුම් දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබාදුන් අතර පෙබරවාරි මස අවසාන සතිය තුලදී එය සිදුකර අවසන් කල යුතු බව තීරණය කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 03 | බස්නාහිර පළාත් ගුරු විභාග අයදුම් කරුවන්ගෙන් අයකළ විභාග ගාස්තු ආපසු ගෙවීම සම්බන්ධව | මුදල් ආපසු ගෙවීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය ලබාගෙන ඇති බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>එම මුදල්ආපසු ගෙවීම පළාත් රාජ්‍ය කොමිෂන් සභාව හරහා සිදු කල යුතු බවත් එම මුදල් පිළිබඳ සටහන්ව ඇති අතර එය ගෙවීමට අනුමැතිය ලබා දීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය සමඟ අදාළ තොරතුරු ප්‍රධාන ලේකම් කාර්යාලයේ මූල්‍ය අංශය වෙත දැනුම් දෙන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් දැනුම් දෙන ලදී.<br>තවද එය ආපසු ගෙවන බවට ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් දැනුම් දීමක් සිදු කරන අතර මුදල් ලබාදෙන ක්‍රමවේදය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කල අතර විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් එම මුදල් ආපසු අයදුම්කරුවන් වෙත ලබා දීම සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 04. | 2023 පළාත් පාලන මැතිවරණ සමය තුල කාර්යාල කටයුතු සම්බන්ධව | 2023 පළාත් පාලන මැතිවරණ කාල සීමාව තුල අත්‍යාවශ්‍ය කරුණු සඳහා ස්ථාන මාරුසිදු කිරීමට අවශ්‍යතාවයක් වේ නම් මැතිවරණ කොමසාරිස්ට දන්වා අනුමැතිය ලබාගෙන එය සිදු කිරීමේ හැකියාවක් පවතින බව ප්‍රධාන ලේකම් විසින් දැනුවත් කරන ලදී.<br>තවද ඡන්ද රාජකාරී සඳහා අමාත්‍යාංශ වලින් වාහන ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවට කරුණු ඉදිරිපත් වූ අතර ඒ අනුව ඡන්දය පැවැත්වීම සම්බන්ධව ගැසට් නිවේදන නිකුත් කිරීමෙන් අනතුරුව එම කාල සීමාවට පමණක් අමාත්‍යාංශ වල වාහන ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 05. | ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනයේ ගැටළුව සම්බන්ධ | මේ සම්බන්ධව අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡාවක් සිදුකළ අතර එම ක්‍රීඩා සංකීර්ණය බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයට මෙන්ම මධ්‍යම රජයේ ක්‍රීඩා අමාත්‍යාංශය හා පාපන්දු සම්මේලනය යන පාර්ශවයන් තුනක් භාරයේ පවතින බවත් පාපන්දු සම්මේලනය සඳහා මෙම ක්‍රීඩාංගනය තිස් අවුරුදු ගිවිසුමකට යටත්ව ප්‍රාදේශීය ලේකම් විසින් පවරා දී ඇති බවත් ප්‍රධාන ලේකම් විසින් සඳහන් කරන ලදී.<br>ඒ අනුව විගණන විමසුම් යොමුවී ඇත්තේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් නව ඉදිකිරීම් සිදු කිරීම සම්බන්ධව වන අතර මෙම ක්‍රීඩා සංකීර්ණය පාර්ශව තුනක් භාරයේ පවතින බැවින් ක්‍රීඩාංගනයේ එක් එක් කොටස් එම පාර්ශව තුන යටතේ පවත්වාගෙන යාම සඳහා අවබෝධතා ගිවිසුමක් සකස් කිරීමේ අවශ්‍යතාවය ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදී.<br>ඒ අනුව එක් එක් පාර්ශවයන් යටතේ පවතින කොටස් අනිත් පාර්ශවයන් භාවිතා කරන්නේ නම් ඒ සඳහා අය කිරීමක් සිදුකල යුතු අතර එය බෙදී යාම සම්බන්ධව හා අනෙකුත් කරුණු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා තොරතුරු ලබාගෙන පාර්ශව තුන සමඟ අවබෝධතා ගිවිසුමක් සකස් කිරිම සම්බන්ධව සාකච්ඡා කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br>ප්‍රධාන නීති නිළධාරී |
| 06. | කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීම | කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීමට අදාළ වාර්තා සකස් කරමින් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව සෑම ආයතනයක්ම නියෝජනය වන පරිදි හා නව කරුණුද ඇතුලත් වන පරිදි එය සකස් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 07. | බස්නාහිර පළාත් සභාවට FB ගිණුමක් සකස් කිරීම සම්බන්ධව | මේ වන විට බස්නාහිර පළාත් සභාවේ සියළු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන ඇතුලත් වන පරිදි FB ගිණුමක් සකස් කර ඇත.<br>එහි තම ආයතනවල සිදු කරන විශේෂ වැඩසටහන් පළකිරීමට හැකියාව පවතී. විශේෂයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන අංශයේ සිදු කරන වැඩසටහන්,කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සිදුකරන කෘෂිකාර්මික කටයුතු යනාදිය මෙහි පළ කිරීම කෙරෙහි සැලකිලිමත් වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 08. | ආණ්ඩුකාර කුසලාන ක්‍රීඩා තරගාවලිය සම්බන්ධව | මෙම තරඟාවලිය ක්‍රීඩා අධ්‍යක්ෂ සමඟ සම්බන්ධවී සැලසුමක් සකස් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>මෙම සමස්ත තරඟාවලිය පෞද්ගලික ආයතනයක අනුග්‍රාහකත්වය යටතේ පැවැත්වීමට බලාපොරොතතු වන අතරම එක් එක් ආයතන වල යෝජනා ලබාගෙන යෝජනාවලියක් සකස්කර ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එය ක්‍රියාවට නැංවිය හැකි බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 09. | ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීමේදී අඩු ආදායම් සීමාව යාවත්කාලීන නොකිරීම සම්බන්ධව | අඩු ආදායම් ලාභී පුද්ගලයන් සඳහා විවිධ සහනාධාර හා රෝගාධාර ලබා දීමේදී මෙන්ම ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීමේදී ආදායම් සීමාව මාසිකව රු.6000.00 ට අඩු ලෙස සලකා බැලීම යාවත්කාලීන නොවීම සම්බන්ධව ඉදිරිපත් වී ඇති ගැටළු පිළිබඳ කරුණු සාකච්ඡා කරන ලදී.<br>මේ සඳහා තීරණයක් ලබා ගැනිම සඳහා මෙම ගැටළුව මුදල් අමාත්‍යාංශය වෙතින් විමසීම් සිදු කිරීම සුදුසු බව තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 10. | දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ පැවැත්වෙන සාකච්ඡාව සම්බන්ධව | බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක 3හි දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් 40 දෙනා සමඟ ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සාකච්ඡාව 2023.02.16 දින සිදු කරන අතර එහිදී සාකච්ඡා කිරිමට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් යොමුවී ඇති ගැටළු අදාළ අමාත්‍යාංශ වලට කඩිනමින් යොමු කිරීමට බලාපොරොත්තු වන බවත් එම ගැටළු සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 11. | බස්නාහිර පළාත් සියලු අමාත්‍යාංශවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ මට්ටමින් පවතින විවිධ තනතුරු සඳහා පවතින පුරප්පාඩු සම්බන්ධව ඉදිරිපත් කරමින් ඒවා සම්පූර්ණ කිරිම පිළිබඳ සාකච්ඡා කරන ලදී.ඒ අනුව නව බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් පවතින පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොපවතින අතර එම පුරප්පාඩු වලින් අත්‍යාවශ්‍යම වන පුරප්පාඩු සංඛ්‍යාව පමණක් ඒවා සම්පූර්ණ කිරීමේ සාධාරණ හේතු සාධක දක්වමින් පවතින ප්‍රමාණය හා අත්‍යාවශ්‍ය බැවින් ඉල්ලුම් කරන ප්‍රමාණය පැහැදිලිවම දක්වමින් මේ සම්බන්ධ වාර්තාව ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද තනතුරු සඳහා පත්කිරීම් මෙන්ම සීමිත පදනමින් සිදු කරන උසස්වීම්ද තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇති බැවින් එම උසස් කිරීම් සිදු කිරීමද අත්හිටුවා ඇති බැව් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.උසස්වීම් නතර කිරීම එම නිලධාරීන්ට සිදුකරන මහත් අසාධාරණයක් වන අතර එක පාර්ශවයකට උසස්වීම් ලබා දීමටත් තවත් පාර්ශවයකට උසස්වීම් අත්හිටුවීමත් කල නොහැකි වන බැවින් තනතුරු සඳහා නියමිත උසස්වීම් ලබා දීම සිදුකල යුතු බවටත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 12. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු ලබා දීම | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සිදු කරන කටයුතු තොරතුරු තාක්ෂණ භාවිතා කරමින් සිදු කරන අතර ඒ සඳහා කාර්යක්ෂම තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු යෙදවීමේ අවශ්‍යතාවය පිළිබඳ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව මේ වන විට ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ ඒකකයේ ඒ සඳහා සුදුසු තොරතුරු තාක්ෂණ නිළධාරියෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුයුක්ත කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී . | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 13. | රාජ්‍ය ආයතනවල වියදම් පාලනය සම්බන්ධ නව චක්‍රලේඛ අනුව කටයුතු කිරිම | වියදම් පාලන චක්‍රලේඛය සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් සියලූ ලේකම්වරුන්ගේ අවධානය යොමු කරවන ලදී.<br>ඒ අනුව මුදල් කොමිෂන් සභාවේ පැවති සාකච්ඡාවේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් ලැබෙන ප්‍රතිපාදන සම්බන්ධව අවිනිශ්චිත තත්ත්වයක් පවතින බවත් පළාත් සංවර්ධන ප්‍රදාන මඟින් ලැබෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගැටළුවක් ඇති නොවන බවත් දැනුම් දුන් බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව වියදම් පාලන චක්‍රලේඛය උල්ලංඝනය කර කටයුතු කරන සියළුම ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව ඒ වෙනුවෙන් වගකිව යුතුවන අතරම සියලූම ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් එම චක්‍රලේඛය හොඳින් අධ්‍යනය කර ඒ අනුව කටයුතු කල යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලූම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලූම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 14. | කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධව | කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන් සම්බන්ධයෙන් සිදුකර ඇති වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ පවතින ගැටළු සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.ඒ අනුව සේවයේ අවශ්‍යතාවය මත එම ස්ථානමාරු සිදුකර ඇති නමුත් ඔවුන් විසින් ඉදිරිපත්කර ඇති අභියාචනා පාදක කර ගනිමින් එම ස්ථාන මාරු මේ වන විටත් අවලංගු කර ඇති අතර ඒ නිසා පරිපාලනමය ගැටළු රැසකට මුහුණ දීමට දෙපාර්තමේන්තුවට සිදුවී ඇති බවට වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව මේ සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙතින් තොරතුරු විමසා සිටි අතර ඔවුන් අභියාචනා ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමේදී එම කරුණු මානුෂීය වන බවත් මෙහි පරිපාලනමය ගැටළුවක් පවතින අතර එම ගැටළුව විසඳීම සඳහා අවසාන අභියාචනා බලධාරියා වන ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට සිදුවන බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>මෙම ස්ථාන මාරු සම්බන්ධව ගැටළු සහගතම නිළධාරීන්ගේ ස්ථාන මාරු සඳහා පමණක් තීරණයක් ගැනීමට ආණ්ඩුකාරතුමා වෙත තොරතුරු ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 15. | විගණන කටයුතු සඳහා තොරතුරු ලබා දීම සම්බන්ධව | බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ ලේඛණ හා වවුචර් විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් විගණකාධිපති විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරයා වශයෙන් ප්‍රධාන ලේකම්ට පිටපත් සහිතව සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් වෙතින් කරුණු විමසා ඇති බවට සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව විගණන සඳහා අවශ්‍ය ලිපි ලේඛන විගණනය සඳහා ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක විධිමත් පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් එසේ නොමැති වුවහොත් විනයානුකූලව කටයුතු කිරීමට සිදු වන බවත් දන්වා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත අවධාරණාත්මක ලිපියක් යැවීමට කටයුතු කරන ලෙසත් එම නිලධාරියාට අවවාද කළ බව දැන්වීම සඳහා එම ලිපියේ පිටපතක් විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>එමෙන්ම අභ්‍යන්තර විගණන අංශය මගින් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ ලේඛණයන්ද ඇතුලුව විගණනයක් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් අභන්තර විගණන අධ්‍යක්ෂ වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේදී විධිමත් පරිදි තොරතුරු ඉදිරිපත් කරන පෙත්සම් ආදිය සඳහා පමණක් විගණන කටයුතු සිදු කරන ලෙසත් ඒ පිළිබඳ තමා දැනුවත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු විගණන කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලෙසත් වැඩි දුරටත් දන්වන ලදී.<br>විගණන විමසුම් සඳහා පිළිතුරු ලිවීමේදී ලබා දෙන තොරතුරු විධිමත් පරිදි ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යංශය<br><br>සියලුම අමාත්‍යංශ ලේකම්වරු<br><br>අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන |
| 16. | රෝහල්වල පවතින යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා ඉංජිනේරු වරයෙකු යෙදවීම සම්බන්ධව | රෝහල්වල පවතින රෝග විනිශ්චය සඳහා යොදාගනු ලබන යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා ඉංජිනේරු වරයෙකු යෙදවිය යුතු නමුත් එවැනි තනතුරක් පිරිස්බල තක්සේරුවෙහි ඇතුලත්ව නොමැති බැවින් ඒ සම්බන්ධ ගැටළුවක් පවතින බවත් ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කරන රාජකාරී අනුව ගෙවීම් සිදු කිරීමට ඉංජිනේරුවරයෙකු යෙදවීමට කටයුතු කල හැකි බවත් සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එය අනුමැතිය සඳහා ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට සාධාරණීයකරණ හේතු මත පවතින අවශ්‍යතාව තමා වෙත දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යංශය |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 17. | සති අන්ත නිවාඩු දිනයන්හි හා රජයේ නිවාඩු දිනයන්හි කාර්යාල විවෘත කිරීම සම්බන්ධව | වර්ෂ අවසාන රාජකාරී කටයුතු සිදු කිරීම වෙනුවෙන් සති අන්ත දිනවල හා රජයේ නිවාඩු දිනවල කාර්යාල විවෘත කිරීමට අනුමැතිය ලබා දුන් අතර මේ වන විටත් නිවාඩු දිනයන්හි අතිකාල සේවයේ නිරත වීමට ඉල්ලුම්පත් ඉදිරිපත් වන බැවින් නිවාඩු දින වලදී සේවයේ යෙදීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් විමසා සිටින ලදී.<br>ඒ අනුව රාජ්‍ය වියදම් පාලනය සඳහා කටයුතු කරන ලෙස චක්‍රලේඛයක් ද නිකුත්කර ඇති බැවින් අතිකාල ගෙවීම සිදුකල නොහැකි වන අතරම විදුලිය ජලය සඳහා වැයවන වියදම් අවම කර ගැනිමට කටයුතු කලයුතු බැවින් නිවාඩු දිනයන්හි සේවය නොකරනා ලෙසත් , අත්‍යාවශ්‍යම කටයුතුතක් සඳහා සේවයේ යෙදෙන්නේ නම් ඒ සම්බන්ධව ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 18. | රජයේ ආයතන නීති කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තු වේ සහය ලබා ගත යුතු බවට ඉදිරිපත්කර ඇති කැබිනට් තීරණය සම්බන්ධව | රාජ්‍ය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන නීතිමය කටයුතු සම්බන්ධයෙන් පෞද්ගලික නීති සහය ලබා ගැනීම සඳහා වියදම් දැරීමකින් තොරව සෑම විටම නීතිපති දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනිම සඳහා කැබිනට් මණ්ඩලය මගින් නිකුත්කර ඇති කැබිනට් තිරණය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ඉදිරිපත් කරන ලදි.එහි සඳහන් මූලික කරුණු නම් ,<br><br>✓ රාජ්‍ය ආයතනයකට පිටස්තර ආයතනයක් නඩුවක් පවරන්නේ නම් නීතිපතිවරයා එම ආයතනය වෙනුවෙන් පෙනී සිටිය යුතුය.<br><br>✓ පිටින් නීතිඥවරයෙකු සම්බන්ධකරගත යුතු බවට විශේෂ තත්ත්වයක් පවතී නම් එවිට නීතිපතිගේ එකඟතාවය ඇතිව මුදල් අමාත්‍යාංශ හා අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.<br><br>✓ රජයේ ආයතනයක් විසින්ම රජයේ ආයතනයකට නඩුවක් පවරන්නේ නම් නීතිපති එය ප්‍රතික්ෂේප කරන්නේ නම් අනිවාර්යයෙන් මුදල් අමාත්‍යාංශයේ හා අධිකරණ අමාත්‍යාංශයේ කැමැත්ත ඇතිව සිදුකල යුතුය.<br><br>✓ එමෙන්ම යම් රජයේ ආයතනයක් මෙම නීති රීති වලට එකඟ නොවී පිටින් මෙම කටයුතු සිදු කරන්නේ නම් ඒ සම්බන්ධව පෞද්ගලිකව වගකිව යුතුය.<br><br>මෙම කැබිනට් සන්දේශය ඉදිරිපත් කර ඇත්තේ සමස්ථ රාජ්‍ය සේවයේ හා ව්‍යවස්ථාපිත ආයතන මූලික කරගෙන වන අතර මෙය පළාත් සභාවට අදාළ කර ගැනිම පිළිබඳ නීතිපති මගින් පැහැදිලිකර ගැනීමක් සිදුකර ගත යුතු බවට ප්‍රධාන නීති නිලධාරී විසින් අදහස් දක්වන ලදී.ඒ අනුව කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>ප්‍රධාන නීති නිලධාරී |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 19. | දේශිය නිවාඩු ලබා ගැනිම සඳහා සකස්කරන ලද ඉල්ලුම්පත්‍රය අමාත්‍යංශ සඳහා අදාළ කර ගැනිම සම්බන්ධව | නිලධාරීන් සඳහා වසර 5ක දේශීය නිවාඩු ලබා ගැනීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සමඟ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බැවින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන් වෙනුවෙන් ඉල්ලුම් පත්‍රයක් සකස් කර ඇති අතර එය පළාත් අමාත්‍යංශ සඳහා අදාළ කර ගැනිම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව එම ඉල්ලුම් පත්‍රය සියලු අමාත්‍යංශ වල අදාළ නිවාඩු ඉල්ලීම් වලදී භාවිතා කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.